

මා ලියූ

# රචනාවක හැඩ බලමු




උමේෂි අයන්සා වනිගසේකර

කණිෂ්ඨ බාලිකා විදුහල - නාවලපිටිය



**කෘතියේ නම**

# මා ලියූ

# රචනාවක හැඩ බලමු

**කතෘගේ නම**

## උමේෂි අයන්සා වනිගසේකර

# පිදුම

රචනාවක් හැඩට ලියන්න මඟ පෙන්වූ

මප/ගම් අනුරුද්ධ කුමාර ජාතික පාසලේ

ආනන්ද ආර්. පීරිස් ගුරු පියාණන්ට

ආදරයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එළඳායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "**දිවිය දිනන විද්‍යුත් පොතක්**" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "**දිවිය දිනන විද්‍යුත් පොතක්** "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි


ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


2023 10 20

# පටුන


1. මුහුදු වෙරළ ඉතා සුන්දරයි 6
2. සුන්දර කෙතක අසිරිය 7
3. අපි යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරමු 8
4. කුරුල්ලෙකු මෙන් පියාඹා යා හැකි නම් 9
5. පාසලේ පැවති නිවාසාන්තර ක්‍රීඩා උත්සවය දා 10
6. කුරුල්ලෝ අපට සම්පතකි 11
7. ඩෙංගු මදුරුවන් බෝවීම වැලක්වීමට අපට කළ හැකි දේ 12
8. මගේ මල් වත්ත ඉතා සුන්දරය 13
9. ජලය අපට සම්පතකි 14
10. උදෑසනක අසිරිය 15
11. මා නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේදී දිව්මේ තරගය ජයග්‍රහණය කළ මොහොත 16
12. සැඳෑ කාලයක අසිරිය 17
13. නියගය නිමා කරමින් වැසි ඇද හැලුණු දා 18
14. මට පියාපත් ලැබුණහොත් 19
15. පොදු දේපල සුරැකීම අපගේ යුතුකමකි 20
16. අපි අන් අය සමඟ සමගියෙන් ජීවත් වීමට කළ යුතු දේවල් 21
17. සඳ පායා ඇති රාත්‍රියක සුන්දරත්වය 22
18. නිර්මාණාත්මක වැකි ලිවීම 23
19. නිර්මාණාත්මක වැකි ලිවීම 24
20. නිර්මාණාත්මක වැකි ලිවීම 25
21. නිර්මාණාත්මක වැකි ලිවීම 26


කඳුරට ජීවත් වන මා පවුලේ සියලුදෙනා සමඟින් ප්‍රථම වතාවට මුහුදු බඩ ප්‍රදේශයකට විනෝද චාරිකාවක් ගියෙමු. රැල්ල නැඟඑන හෝ ගානා පොකුණ සියැසින් දුටුවෙමි. එහි සිරි විඳගත්තෙමි.

## මුහුදු වෙරළ ඉතා සුන්දරයි

- පලසක් එලා ඇති සේ පෙනෙන මුහුදු වැලිතලාව ඉතා සුන්දර දසුනකි.
- මුහුදු වෙරළ සිපගන්නා මුහුදු රැල්ල ද ඉතාමත් චමත්කාරය.
- සවස් කාලයේදී ඈත මුහුදේ හිරු දිලෙන ගිනි බෝලයක් ගිල ගන්නා මෙන් මනරම් දසුනක් මවයි.
- මුහුදු ගිය බෝට්ටු ලතාවකට වැනී වැනී ගොඩබිම කරා ඇදී එන අයුරු ඉතා මනරම් ය.
- වෙරළ වටා ඇති පොල් ගස් පෙළ වෙරළ ආරක්ෂා කරන මුරකරුවන් සේ දිස්වේ.

# සුන්දර කෙතක අසිරිය

- රන්වන් පාටින් බබළන වී කරල් කෙතට අලංකාරයක් ගෙන දෙයි.
- වක්කඩ උඩ සිටගෙන සිටින කොකුන් නිසා කෙතේ සුන්දරත්වය තව තව වැඩි වේ.
- මැද සිටගෙන කෙත මුරකරනා පඹරාල කෙතේ අලංකාරය දෙගුණ කරයි.
- නියර දිගේ ඇඹුල අරන් එන ගෙවිලිය කෙතටම සිරියාවයි.




නිරෝගි දිවිපෙවතක් ගතකිරිම සඳහා නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරිම අත්‍යාවශ්‍ය වේ.

## අපි යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරමු.

- උදෑසන ම අවදි වී පිරිසිදු ජලය විදුරුවක් පානය කිරිමෙන් ශරීරය නීරෝගි වේ.
- දිනපතා දවසට දෙවරක් දත් මැදිම අපේ යහපත් සෞඛ්‍ය පුරුද්දකි.
- සමබර ආහාර වේලක් ගැනීමට පුරුදු වීමද යහපත් සෞඛ්‍ය පුරුද්දකි.
- පිරිසිදු ඇදුම් ඇඳිම හා අප පිරිසිදුව සිටිමෙන් අප ලෙඩ රෝග වලින් ද ආරක්ෂා වේ.






සඳලුතලයේ සිට අහසේ සිරි නරඹමින් සිටිනා විට අහස පුරා නිදහසේ පියාඹා යන කුරුලු රැන් දුටුවිට ඇතිවන්නේ දැඩි ආසාවකි.

## මට කුරුල්ලෙක් මෙන් පියාඹා යා හැකි නම්

- මම කුරුල්ලෙකු මෙන් පියාඹා යා හැකි නම් නිදහසේ අහසේ පියාඹින් අහසේ සිරි නරඹමි.
- පලතුරු පිරුණු ගසක අත්තක් මත ලස්සන ම කූඩුව මම සාදමි.
- මම ඈත අහසේ පියාඹන කුරුල්ලන් සමඟින් සතුටු සාමිචියේ යෙදෙමි.
- මම මලින් මලට පියාඹමින් පාට පාට මල් පැණි රස බලමි.




# පාසලේ පැවති නිවාසාන්තර ක්‍රීඩා උත්සවය දා

- එදින ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් පැමිණියේ කලාප අධ්‍යපන අධ්‍යක්ෂක තුමාය.
- පාසල් තූර්ය වාදන කණ්ඩායම විසින් මනරම් සංදර්ශනයක් ඉදිරිපත් කර හැමෝව සතුටු කරවන ලදී.
- එදින අප විවිධ ක්‍රීඩා තරඟවල නිරත වෙමින් බොහෝ සතුටු වූහ.
- පහළ පන්ති වල ළමුන්ගෙ සරඹ සංදර්ශනය දෙස සියලු දෙනා බලා සිටියේ ඇසිපිය නොහෙළාය.



# කුරුල්ලෝ අපට සම්පතකි

- කුරුල්ලන් දැකීමෙන් අප සිතට මහත් මානසික සුවයක් දැනේ.
- පරිසරයේ අලංකාරත්වය වැඩි කිරීමට කුරුල්ලන් ද දායක වේ.
- කුරුලු කීචිබීචි නාදය කනට ගෙනදෙන්නේ අමුතුම මිහිරකි.
- ශාක බෝවීම සඳහා ද කුරුල්ලෝ දායක වීමෙන් පරිසරයට විශාල සේවයක් කරති.



ඊඩිස් ඊජිප්ටයිස් හා ඊඩිස් ඇල්පොබික්ටස් නම් රෝගකාරක මදුරුවන් දෂ්ට කිරිමෙන් බෝවන මාරාන්තික රෝගයකි ඩෙංගු. ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වැලක්වීම සඳහා මදුරුවන් බෝ නොවන ලෙස වගබලා ගැනිම අපගේ වගකීමකි.


## ඩෙංගු මදුරුවන් බෝවීම වැලක්වීමට අපට කළ හැකි දේ

- මාරාන්තික ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන අප විනාශ කළ යුතුය.
- ජලය රැදෙන කෝප්ප, පොල්කටු, ටින් බෙලෙක්ක ආදිය විනාශ කළ යුතුය.
- අවට පරිසරය මදුරුවන් බෝ නොවන හා ජලය නොරැදෙන ලෙසට නිතර පිරිසිදුව තබා ගත යුතුය.
- ජලය රැදෙන තැන් වැලි දමා පුරවා දැමීම, වැහිපිහිලි ආදිය ජලය නොරැදෙනසේ පිරිසිදු කළ යුතුයි.



# මගේ මල් වත්ත ඉතා සුන්දරය

- නොයෙක් පාට පාට මල් වර්ග වලින් පිරිනු මගේ මල් වත්ත ඉතා සුන්දර ස්ථානයකි.
- මල් පැණි බීමට පැමිණෙන සමනලුන් එය තව තවත් අලංකාර කරයි.
- නිතර ගැවසෙන කුරුල්ලන් හා ඒ කුරුලු නාදය නිසා මල් වත්ත ඉතා ප්‍රිය ජනක තැනක් වි ඇත.
- විවිධ මල් වර්ග වලින් හමන සුවඳ නිසා හිතට අමුතුම සතුටක් ගෙනදෙයි.






# ජලය අපට සම්පතකි


- අපගේ මූලික අවශ්‍යතාවයක් වන ජලය අපගේ පිපාසය සංසිඳුවයි.
- කෘෂිකාර්මික කටයුතු වලට හා බොහෝ නිෂ්පාදන සඳහා ද ජලය අත්‍යාවශ්‍ය වේ.
- අපට අවශ්‍ය විදුලිය නිපදවීමට ද දායක වෙන ජලය අපට මහගු සම්පතකි.
- ගස්වැල් වල පැවැත්මට ද අත්‍යාවශය වන දෙයකි ජලය.





# උදෑසනක අසිරිය

- උදෑසනම කඳු මුදුන් අතරින් රන් වන් හිරු පායා එන අයුරු ඉතා මනරම්ය.
- කෑම සොයමින්  කුරුලු රෑන් කුඩු වලින් යුහුසුළුව ඉගිළි යති.
- හමා එන සීතල නැවුම් සුළඟින් ගස් වැල් මෙන්ම අපි ද ප්‍රබෝදමත් වේ.
- කුරුල්ලන්ගේ කීච්බීච් නාදය උදෑසන නිහඬතාවය බිඳ දමයි.




මෙවර පාසලේ පැවති නිවාසාන්තර ක්‍රිඩා උත්සවයේදි මීටර 100 දිවිමේ තරගයෙන් මාගේ නිවාසය නියෝජනය කරමින් තරග වැදීමට සඳහා මා තේරු තිබුණි. මගේ තරගය ජයග්‍රණය කර මගේ නිවාසය දිනවීමට දායක වීම සදහා මා මුල සිටම දැඩි අදිටනින් සිටියෙමි.

## මා නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ දී දිව්මේ තරගය ජයග්‍රහණය කළ මොහොත

- මා තරගයේ පළමුවැන්නා වූ මොහොතේ ප්‍රේක්ෂකාගාරයේ සිටි අය අත්පුඩි ගසමින් ඔල්වරසන් දුන්හ.
- ඔල්වරසන් හඬ ඇසෙන විට මාගේ සිතට දැනුණේ විශාල සතුටකි.
- මාගේ නිවාසයේ යෙහෙළියෝ දුවවිත් මා වැලඳගනිමින් මට සුභ පැතූහ.




- නිවාසයේ ජයග්‍රහණය සඳහා මා ද දායකවු නිසා මට මහත් ආඩම්බරයක් දැනුණි.





# සැදෑ කාලයක අසිරිය

- සැදෑ කාලයේ කෑම සෙවීමට ගිය කුරුලු රංචු රෑන් පිටින් නැවත තම කැදලි කරා පියාඹා යති.
- කෙමෙන් කෙමෙන් ආලෝකය අඩු වී අඳුර පැතිරෙමින් සවස් කාලය පැමිණෙන බව හඟවයි.
- ගිනි බෝලයක් වැනි හිරු කඳු අතරින් නොපෙනී යාමට පටන් ගනී.
- හඳ තරු පිරිවරාගෙන අහස දෙසට කෙමෙන් කෙමෙන් ළඟා වෙයි.



මාස කිහිපයක් තිස්සේ වැසි පොදකුදු නොමැතිව සියලු වගා පාලුවට යමින් තිබුණි. ගමේ ගොවිතැන් හි නියැලෙන සියලු දෙනා මහත් කනස්සලෙන් කරකියාගත හැකි දෙයක් නොමැතිව ලතවෙමින් කල් ගෙවීය. ගස්වැල් සියල්ල මැරී යමිනි බීමට ජලය නොමැතිව පොළොව ද ඉරිතලා යමින් තිබුණි.

## නියගය නිමා කරමින් වැසි ඇද හැලුණු දා

- ජලය නොමැති ව දැඩි දුකින් සිටි සියලුදෙනා ට විශාල සතුටක් ඇති වුණි.

- නියගය නිමා කරමින් ඇද හැලුණු වැස්සෙන් සිඳී තිබු වැව් පොකුණු යළි ජලයෙන් පිරී ගියේය.
- ජලය නොමැතිව මැලවී තිබු ගස්වැල් වලටද නව පණක් ලැබුණි.
- ගොවිතැන් කටයුතු කරගැනිමට නොහැකිව අසරණ වී සිටි ගොවියෝ ප්‍රීතිඝෝෂා නැගූහ.



# මට පියාපත් ලැබුණහොත්

- මට පියාපත් ලැබුණහොත් නිදහසේ අහසේ ඈතින් ඈතට මම පියාඹා යමි.
- සෑම සුන්දර ස්ථානයකම මම අහසේ සිට සුන්දරත්වය විඳිමි.
- අනෙක් කුරුල්ලන් පසු කරමින් ඉතා වේගයෙන් පියාඹමින් දස්කම් දක්වමි.
- මගේ ලස්සන අත්තටු විහිදුවමින් අහසේ සිට රැගුම් පෑම මාගේ බලාපොරොත්තුවයි.



# පොදු දේපල සුරැකීම අපගේ යුතුකමකි

- අපගේ පොදු පරිහරණයට ඇති දේපල අප ආරක්ෂා කර අනෙක් අයෙගේ පරිහරණයට ද ඉතිරි කළ යුතුය.
- වාහන වල සීට් ඉරීම, කුරුටු ගෑම, බිත්ති වල ඇඳීම, කඩා දැමීම ආදිය නොකිරීමට අප පුරුදු විය යුතුයි.
- පොදු දේපල අප භාවිත කළ යුත්තේ අන් අයටද භාවිත කිරීමට හැකිවන ආකාරයටයි.
- කවුරුන් හෝ පොදු දේපල හානි කරනු දුටු විට අප ඉදිරිපත් වී එය නැවතීම අපගේ යුතුකමකි.


විවිධ ජාති ආගම් අදහන් මිනිසුන් ජීවත් වනරටක් වෙසෙන අප සියලු දෙනා සමගම සාමයෙන් සමගින් කටයුතු කිරීම ඉතා වැදගත් වේ

## අපි අන් අය සමඟ සමගියෙන් ජීවත් වීමට කළ යුතු දේවල්

- අපි අන් අය සමග සමගියෙන් ජීවත් වීමට නම් එකිනෙකට උදවු කරගත යුතුය.
- කවරෙක් හෝ වැරදි මඟ සිටියහොත් අපි ඔහුට හරි මඟ කරුණාවෙන් පෙන්වා දිය යුතුය.
- අපි අනෙකුත් ආගම් සමඟ ද සුහදශීලිව කටයුතු කිරීමෙන් අපගේ සහයෝගීත්වය තව තවත් වැඩි වේ.
- අනෙක් අයගේ අදහස් වලට සවන් දීමෙන් ද අපට සමගිය ඇති කරගත හැකිය.

# සඳ පායා ඇති රාත්‍රියක සුන්දරත්වය

- රාත්‍රී අහසේ සඳ අප දෙස එබී බලන්නාක් මෙන් පෙනෙයි.
- සඳ පිරිවරාගෙන පායා ඇති තරුද රාත්‍රී අහසට සුන්දරත්වයක් එක් කරයි.
- වලාකුළු අතරින් පෙනෙන සඳරැස් රාත්‍රී අහසට චමත්කාරයක් ගෙන දෙයි.
- හඳ එළියට රැවටුනු බල්ලන්ගේ උඩු බිරිමේ හඬ ද ඇතින් ඇසෙයි.



# පින්තූරය දෙස බලා නිර්මාණාත්මක වැකි ලිවීම



- කාන්තාවෝ පිරිසකි සතුටින් රබන් ගසමින් විනෝද වෙති.
- තවත් දෙදෙනෙක් දෙපිලකට බෙදී කොට්ටා පොර ක්‍රීඩාවේ නිරත වෙති.
- පිරිසක් එක් වී නැකතට කිරි ඉතිරිවීම සඳහා ලිපගිනි මොලවති.
- අක්කා සහ නංගි සතුටින් ඔන්චිලි වාරම් කියමින් ඔන්චිලි පදිති.

# පින්තූරය දෙස බලා නිර්මාණාත්මක වැකි ලිවීම



- ළමයි පිරිසක් වෙරළේ සිට බොහෝ සතුටින් විනෝද වෙමින් සිටිති
- ඈතින් පිහිටි කුඩා දූපතේ සරුවට හැදුනු පොල් ගස් පෙනේ.
- නිල් පලසක් එලුවාක් මෙන් පෙනෙන මුහුද ඉතා අලංකාරයි
- මුහුදු වැලි වලින් සෙල්ලම් මාලිගා හදමින් කුඩා ළමුන් විනෝද වෙති.

# පින්තූරය දෙස බලා නිර්මාණාත්මක වැකි ලිවීම



- ඇළ මාර්ගයක නිල් පැහැයෙන් ජලය අලංකාර ලෙස ගලා යයි.
- විවිධ පැහැ ගස් හා මල් නිසා එම පරිසරයම අලංකාර වී ඇත.
- එළදෙනුන් කෙමෙන් කෙමෙන් ඇළ පහරින් ගොඩ වී පියමං කරති.
- බැසයන හිරු රැසින් පරිසරයම රත් පැහැ ගැන් වී තිබේ.

# පින්තූරය දෙස බලා නිර්මාණාත්මක වැකි ලිවීම



- උදෑසන ව්‍යායාම පිණිස සිසුහු පාරේ බයිසිකල් පදිති.
- කාන්තාවක් මිහිරි ලෙස ගිටාරය වාදනය කරමින් සිටියි.
- අසලින් ගලා යන දොළ පහරේ ගස්වලින් වැටුණු පත්‍ර පාවී යයි.
- උදෑසන නැඟ එන හිරුගෙන් පරිසරය අලෝකමත් වී ඇත.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දූරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023 10 20

ISBN 978-624-206-684-4